# මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

# ජාතික රක්ෂණ භාර අරමුදල

# රැකියා පුරප්පාඩු

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති ජාතික රක්ෂණ භාර අරමුදල, අග්‍රහාර වෛද්‍ය රක්ෂණ, මෝටර් රථ රක්ෂණය වැනි රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන අතර, දේශීය රක්ෂණ කරුවන්ගේ ප්‍රතිරක්ෂකයා වශයෙන් කටයුතු කරන ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කර ඇති එකම ආයතනය වේ. මෙම අරමුදල් මණ්ඩලය වසර 16ක් වැනි කෙටි කාලයක් තුළදී නව්‍යකරණය, වර්ධනයේ හා ලාභදායීත්වය සැළකීමේදී දේශීය රක්ෂණ කර්මාන්තයේ ප්‍රමුඛ ස්ථානයක් හිමිකර ගෙන ඇති රාජ්‍ය ආයතනයකි.

ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයේ පහත සඳහන් පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. සහකාර සාමාන්‍යාධිකාරී මෙහෙයුම් (HM 1-3) (පහත 1 හෝ 2)

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් කළමනාකරණය / පරිපාලනය පිළිබඳ උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ වෙනත් උපාධියක් ලබා තිබීම.

   සහ

   කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම

   හෝ

   පිළිගත් වරලත් වෘත්තීය කළමනාකරණ ආයතනයක් වෙතින් විෂය ක්ෂේත්‍රයට අදාළව ආයතනික සාමාජිකත්වය ලබා තිබීම. (Associate Membership)

   සහ

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ව්‍යාපාරික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15ක සේවා පළපුරුද්ද

2. පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක් වෙතින් පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම. (Full Membership)

   සහ

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ව්‍යාපාරික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15ක සේවා පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත සුදුසුකම්
2. අදාළ ක්ෂේත්‍රයේ වසර 05ක කළමනාකරණ ගණයේ 1 ශ්‍රේණියේ සේවා පළපුරුද්දක් තිබීම.

**වැටුප් පරිමාණය :** HM 1-3-2016 : රු.86,865.00 - 15x2,270 - 120,915

**වයස** : අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 2. කළමනාකරු - ප්‍රතිරක්ෂණ සහ SRCC (HM 1-2)

**බාහිර අයදුම්කරුවන්**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කළමනාකරණ, පරිපාලන, විද්‍යාව, ගණිතය සහ ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ වෙනත් උපාධියක් ලබා තිබීම.

සහ

පශ්චාත් උපාධියක් ලබා තිබීම

හෝ

පිළිගත් රක්ෂණ ආයතනයක ආයතනික සාමාජිකත්වය ලබා තිබීම. (Associate Membership)

සහ

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ව්‍යාපාරික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15ක සේවා පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම්
2. අදාළ ක්ෂේත්‍රයේ වසර 05ක කළමනාකරණ ගණයේ 1 ශ්‍රේණියේ (MM) සතුටුදායක සේවා පළපුරුද්ද තිබීම.

**වැටුප් පරිමාණය :** HM 1-2-2016 : රු.80,295.00 - 15x2,270 - 114,345

**වයස** : අවුරුදු 30ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට අදාළ නොවේ.

## 3. කළමනාකරු - ප්‍රාරක්ෂණ (HM 1-2)

**බාහිර අයදුම්කරුවන්**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කළමනාකරණ, පරිපාලන, විද්‍යාව, ගණිතය සහ ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ වෙනත් උපාධියක් ලබා තිබීම.

සහ

පශ්චාත් උපාධියක් ලබා තිබීම

හෝ

පිළිගත් රක්ෂණ ආයතනයක ආයතනික සාමාජිකත්වය ලබා තිබීම. (Associate Membership)

සහ

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ව්‍යාපාරික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15ක සේවා පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම්
2. අදාළ ක්ෂේත්‍රයේ වසර 05ක කළමනාකරණ ගණයේ 1 ශ්‍රේණියේ (MM) සතුටුදායක සේවා පළපුරුද්ද තිබීම.

**වැටුප් පරිමාණය :** HM 1-2-2016 : රු.80,295.00 - 15x2,270 - 114,345

**වයස** : අවුරුදු 30ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට අදාළ නොවේ.

## 4. කළමනාකරු - තොරතුරු තාක්ෂණ (HM 1-2)

**බාහිර අයදුම්කරුවන්**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් තොරතුරු තාක්ෂණය පිළිබඳව උපාධියක් ලබා තිබීම.

සහ

පශ්චාත් උපාධියක් ලබා තිබීම

සහ

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ව්‍යාපාරික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15ක සේවා පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම් සපුරා තිබීම.
2. අදාළ ක්ෂේත්‍රයේ වසර 05ක කළමනාකරණ ගණයේ 1 ශ්‍රේණියේ (MM) සතුටුදායක සේවා පළපුරුද්ද තිබීම.

**වැටුප් පරිමාණය :** HM 1-2-2016 : රු.80,295.00 - 15×2,270 - 114,345

**වයස** : අවුරුදු 30ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට අදාළ නොවේ.

## 5. ආයුගණක කළමනාකරු (MM 1-2)

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් ආයුගණක විද්‍යාව/ගණිතය/ සංඛ්‍යානය පිළිබඳ උපාධියක් හෝ එම ක්ෂේත්‍රයට අදාළ වෙනත් උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසරක පශ්චාත් සේවා පළපුරුද්ද තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම් සපුරා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳව අවම වශයෙන් වසර 05ක කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ (JM) සතුටුදායක සේවා පළපුරුද්ද තිබීම.

**වැටුප් පරිමාණය :** MM 1-2-2016 : රු.54,550.00 - 10x1,375 -15x1,910 - 96,950

**වයස** : අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 6. සහකාර කළමනාකරු - නීති සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් (MM 1-2)

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

සහ

නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ රාජ්‍ය, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අවම වශයෙන් වසරක පශ්චාත් සේවා පළපුරුද්ද තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම් සපුරා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳව අවම වශයෙන් වසර 05ක කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ (JM) සතුටුදායක සේවා පළපුරුද්ද තිබීම.

**වැටුප් පරිමාණය :** MM 1-2-2016 : රු. 54,550.00 - 10x1,375 - 15x1,910 - 96,950

**වයස** : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 7. සහකාර කළමනාකරු - අභ්‍යන්තර විගණන (MM 1-2)

**බාහිර අයදුම්කරුවන් (පහත 01 හෝ 02)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් ගිණුම්කරණ, වාණිජ්‍යය, මූල්‍ය, මූල්‍ය කළමනාකරණ, ව්‍යාපාර පරිපාලන හෝ ව්‍යාපාර කළමනාකරණ පිළිබඳ උපාධියක් ලබා තිබීම.

   සහ

   උපාධිය ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසරක පශ්චාත් සේවා පළපුරුද්ද තිබීම.

   හෝ

2. විෂය ක්ෂේත්‍රයට අදාළව වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මාධ්‍යය විභාගය සමත්ව තිබීම.

   සහ

   අන්තර් මාධ්‍යය විභාගය සමත් වීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසරක පශ්චාත් සේවා පළපුරුද්ද තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම්
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳව අවම වශයෙන් වසර 05ක කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ (JM) සතුටුදායක සේවා පළපුරුද්ද තිබීම.

**වැටුප් පරිමාණය :** MM 1-2-2016 : රු.54,550.00 - 10×1,375 -15x1,910 - 96,950

**වයස** : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 8. ප්‍රසම්පාදන නිලධාරී (JM 1-1)

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළගනු ලබන විශ්වවිද්‍යාලයකින් ව්‍යාපාර පරිපාලනය, වාණිජ, මූල්‍ය, අළෙවිකරණ, ගිණුම්කරණ, ප්‍රවාහන හා සැපයුම් කළමනාකරණය, සැපයුම් ජාල කළමනාකරණය හෝ කළමනාකරණ ක්ෂේත්‍රය පිළිබඳ උපාධියක් ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම් සපුරා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳව කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA1), II ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා පළපුරුද්ද තිබීම.

**වැටුප් පරිමාණය :** JM 1-1 – 2016 : රු.42,600- 10 x 755 - 18 x 1,135 – 70,580

**වයස** : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 9. අනුකූලතා නිලධාරී (JM 1-1)

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළගනු ලබන විශ්වවිද්‍යාලයකින් ව්‍යාපාර කළමනාකරණ, රාජ්‍ය පරිපාලන, ව්‍යාපාර පරිපාලන, මානව සම්පත් කළමනාකරණ, කළමනාකරණ අධ්‍යයන හෝ නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම් සපුරා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳව කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA1), II ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා පළපුරුද්ද තිබීම.

**වැටුප් පරිමාණය :** JM 1-1 -2016: රු.42,600- 10 x 755 - 18 x 1,135 – 70,580

**වයස** : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**පත්වීම් :** මෙම පත්වීම් ස්ථිර පත්වීම් වේ. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ඇත.

**කොන්දේසි :**

**සියලුම අයදුම්කරුවන්.**

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට අදාළ කාර්යයන් සිදු කිරීම සඳහා මානසික හා ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය. යහපත් චරිත ස්වභාවයකින් යුක්ත විය යුතුය.

**අයදුම්කරුවන්.**

- ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකු නම් සහ ලිපිනයන් සහිතව සකස් කරන ලද ජීව දත්ත විස්තර සහිත අයදුම්පතක්, සියලුම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද සනාථ කිරීමේ පිටපත් සමග එවිය යුතු වේ. දැනටමත් රාජ්‍ය / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත එවිය යුතු වේ.
- අයදුම්කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සටහන් කළ යුතුය.
- ප්‍රධාන විධායක නිලධාරී, ජාතික රක්ෂණ භාර අරමුදල, නො : 95, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, කොළඹ 02 යන ලිපිනයට 2023.02.13 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ප්‍රධාන විධායක නිලධාරී**

**ජාතික රක්ෂණ භාර අරමුදල**

**නො : 95, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත,**
**කොළඹ 02.**